ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade: 11 | විෂයය Subject: සිංහල | පත්‍රය Paper: III | කාලය Time: පැය 02 |

නම :- ..................................................................................... පංතිය :- ..........................

සැලකිය යුතුයි :-

- 1,2,3,4 ප්‍රශන වලටත් 5,6,7 ප්‍රශ්න වලින් එකකටත් පිලිතුරු ලියන්න=.

---

**01) I සිට x තෙක් ඇති අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න.**

I. "තෝ දියෙන් යන්නෙහි මූට කුමක් කී ද?"

අ) මෙසේ අසන්නේ කවුද?

ආ) 'මූට යනුවෙන් හඳුන්වන තැනැත්තා කවුද?

II. "පන්සිළු වීණා නද පසු බැස් වූ
මන් පිනවන වෙණ නදයෙන් තොස් වූ"

අ) "පන්සිළු" යනු කවරෙක් ද?

ආ) කෝට්ටේ යුගයෙහි දියුණුව පැවැති විද්‍යාස්ථානයක් ලියන්න.

III.

අ) "බැද්දේගම නවකතාවට පසුබිම් වූ දිස්ත්‍රික්කය කුමක් ද?

ආ) බැද්දේගම සිංහලයට පරිවර්තනය කළේ කවුද?

IV.

අ) පහත කවිය සම්පූර්ණ කරන්න.

.....................................................................

.....................................................................

එක් වී මා පුතුගේ ළෙහි
අරන් ගනී හැම දිනෙහි

ආ) මෙය උපුටා ගත් කෘතිය කුමක් ද?

V. "දවස් ගිය සේ නොසුව යැ රෑ මගේ මහුල් අවි දිලිත්"

අ) මෙසේ අවි දිලෙන්නේ කුමන රජතුමාගෙන් ද?

ආ) මෙම පාඨය උපුටා ගත් පාඩමෙහි නම කුමක් ද?

VI.

අ) ජන කවියට අනුරාධපුර යුගය දක්වා දිගු ඉතිහාසයක් ඇති බව සනාථ කෙරෙන කෘතිය කුමක් ද?

ආ) "එකොමත් එක රටක" කෘතියෙහි රචකයා කවුද?

VII. "මා මේසේ කරන්නේ හදතුළ ඇති මහත් වේදනාවකිනි"

අ) මෙසේ පවසන්නේ කවුරුන් ද?

ආ) ඉහත පාඨය ඇතුළත් පාඩමෙහි කතුවරයා කවුද?

VIII. පහත ග්‍රන්ථ ලියවුණු සාහිත්‍ය කෘති නම් කරන්න.

අ) සද්ධර්මරත්නාවලිය ආ) අමා වතුර

IX. "පුත , තෙලලෙස කිරිම තොපටත් අපටත් තරම් නොවෙයි"

අ) මෙසේ පවසන්නේ කවුද?

ආ) මෙය උපුටාගත් පාඩමෙහි නම කුමක් ද?

X.

අ) "සිංහල ජේලී" ලෙස ප්‍රකටව ඇත්තේ කවු ද?

ආ) ඔහු විසින් රචිත කාව්‍ය ග්‍රන්ථයක් ලියන්න.

(ලකුණු 2x10=20)

**02) පහත පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.**

I. "**හී - සතක්** පමණ තැන් පියා යෙයි ගිය කල බුදුහු පෙරට මහත් දක්වා තුමූහු මධ්‍ය වෙති"

අ) මේ අවස්ථාව කුමක් ද?

ආ) ඉරි ගැසූ පදවල අර්ථය ලියන්න.

II. "නොදනිති **හසරක්** නුපුරුදු එ තිදෙන
පැමිණෙන වළකනු කෙලෙස ද"

අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

ආ) මෙසේ සිතන්නේ කවු ද?=

III. "ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ
සුන්දර සුරඹුන්ගේ අතේ
නැළවෙන බව සිතනු පුතේ"

අ) ඉහත කවියෙහි ශබ්දාංකාර දෙකක් ලියා දක්වන්න.

ආ) කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

IV. "දන් දුන් උපාසිකාවෝ ද සිනා පහළ කළා දැක කාරණක් විචාර නොපියා **සමණන්ට** මුන් වහන්සේ සිනාවක් **සී-වී** සේක".

අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.

ආ) පාඨයෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

V. "යටැසින් ලන බාල්මෙන් සුර **විලසී**
වෙසසින් දන මන මත් කැර **එකසී**"

අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

ආ) විශේෂයෙන් ජනතාවගේ සිත මත් වූයේ කුමක් දැකීමෙන් ද?

(ලකුණු 4x5=20)

- **03,04 ප්‍රශ්න වලට වචන 150 – 200 අතර විය යුතුය.**

03)

I. ජීවත් වීම සඳහා සුදුසු ශිල්පයක් හදාරා නොතිබීමත්,

II. හැඟිම්වලට වහල් වී කටයුතු කිරිමත් නිසා තරුණ ජීවිත දුකට පත්වේ. "උග්ගසේන සිටුපුත්හුගේ වස්තුව" ඇසුරෙන් එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්,**

1. යම් යම් අවස්ථාවන් හි මිනිස් සිතෙහි ස්වභාවයත්,
2. උචිත ලෙස අවස්ථා නිරූපණය පිළිබඳව 'අමා වතුර' කතුවරයා දැක් වූ දක්ෂතාවත් උදාහරණ දෙක බැගින් ගෙනහැර පාමින් විමසන්න.

(ලකුණු 15)

04)

I. අජීවී වස්තුන්ට සජීවී බවක් ආරෝපණය කිරිමත්

II. ධ්වනි පූර්ණ බස් වහරක් භාවිතයත් 'ගංහාවේ සංගීතය' පද්‍ය පන්තියෙහි සාර්ථකත්වයට හේතු වී ඇත. උදාහරණ දෙක බැගින් දෙමින් පහදන්න.

**නැතහොත්,**

1. සුරඟන රඟුමෙහි චමත්කාරයත් ,
2. උචිත කාව්‍යෝක්ති භාවිතයත් තුළින් පද්‍ය රසවත්ව ඉදිරිපත් කිරිමට වැත්තැවේ හිමියන් සතුවූයේ අපූරු ප්‍රතිභාවයකි. උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

05) බැද්දේගම නවකතාව කාලීන සමාජ ලක්ෂණ හෙළි කරන සමාජ කැඩපතකි. සනිදර්ශනව ඉදිරිපත් කරන්න.

06) පුද්තල චරිත සංවර්ධනයෙහි ලා නිර්මාණාත්මක ප්‍රයත්තයක යෙදුණු කවියෙකි , එස්.මහින්ද හිමි. 'මුනි සිරිපා' පද්‍ය පන්තිය ඇසුරින් පැහැදිලි කරන්න.

07) සුප්පා දේවිය දැඩි දාරක සෙනෙහසකින් මෙන්ම ස්වාමි භක්තියෙන් ද යුතු කාන්තාවකි. සිංහබාහු නාට්‍ය ඇසුරින් නිදසුන් තුනක් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)